# සවිස්තරාත්මක තත්ත්ව වාර්තා සාරාංශය

(දිනය - 2025.11.27 වේලාව - 1800)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**2025.11.27 දින 0600 පැය සිට 2025.11.27 දින 1800 පැය දක්වා තත්ත්ව වාර්තාව**

| අ.අ | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. සංඛ්‍යාව | ආපදාව | බලපෑමට ලක්වූ පවුල් | බලපෑමට ලක්වූ පුද්ගලයින් | මියයෑම් | තුවාල වූ පුද්ගලයින් | අතුරුදහන් | පූර්ණ නිවාස හානි | අර්ධ නිවාස හානි | ඥාති නිවාසවල සිටින පවුල් | ඥාති නිවාසවල සිටින පුද්ගලයින් | ආරක්ෂිත ස්ථාන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | රත්නපුර | 5 | තද සුළං / ගස් වැටීම් | 11 | 38 | - | - | - | - | 11 | - | - | - | - | - |
| 02 | මොණරාගල | 1 | ජල ගැලීම් | 140 | 470 | - | - | - | - | - | 119 | 387 | 01 | 21 | 83 |
| | එකතුව | | | | | | | | | | | | - | - | - |

*මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට හා උඩුදුම්බර ප්‍රා.ලේ. බල ප්‍ර දේශයන්හි නායයෑම් හේතුවෙන් පුද්ගල අතුරුදන්වීම් 04 ක් මේ වන විට වාර්තා වන බව මහනුවර නි/අ විසින් වාචිකව දැනුවත් කරන් ලදි.

**2025.11.16 දින 0600 පැය සිට 2025.11.27 දින 1800 පැය දක්වා සමස්ථ තත්ත්ව වාර්තාව**

| අ. අ | දිස්ත්‍රික්කය | ප්‍රා. ලේ. සං ඛ්‍යාව | ආපදාව | බලපෑමට ලක්වූ පවුල් | බලපෑමට ලක්වූ පුද්ගලයින් | මියයෑම් | තුවාලවූ පුද්ගලයින් | අතුරුදහන් | පූර්ණ නිවාස හානි | අර්ධ නිවාස හානි | ඥාති නිවාස වල සිටින පවුල් | ඥාති නිවාස වල සිටින පුද්ගලයින් | ආරක්ෂිත ස්ථාන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | මාතර | 5 | අධික වැසි/ගස් හා පස් කඳු කඩා වැටීම්/අකුණු | 100 | 363 | - | - | - | - | 24 | - | - | - | - | - |
| **2** | කළුතර | 2 | අකුණු / තද වැසි | 18 | 52 | - | - | - | 1 | 8 | - | - | - | - | - |
| **3** | ගාල්ල | 5 | ගංවතුර/ පස් කණ්ඩි කඩා වැටීම් /අකුණු | 100 | 291 | 1 | - | - | - | 61 | - | - | - | - | - |
| 4 | යාපනය | 9 | තද සුළං/ ක්ෂණික ගංවතුර/ අකුණු | 221 | 711 | - | - | - | 1 | 15 | 69 | 221 | 1 | 2 | 9 |
| 5 | බදුල්ල | 14 | තද සුළං/ කණ්ඩි කඩා වැටිම් / නාය යෑම් / තද වැසි | 103 | 410 | 21 | 2 | 7 | - | 89 | - | - | - | - | - |
| 6 | කෑගල්ල | 6 | අධික වර්ෂාව හා සුළං/ කණ්ඩි කඩා වැටිම් | 23 | 133 | 7 | 7 | - | 1 | 12 | 1 | 5 | - | - | - |
| 7 | රත්නපුර | 7 | තද වැසි හා සුළං /ක්ෂණික ගංවතුර / ගල් පෙරලිම | 190 | 773 | - | - | - | - | 99 | 39 | 149 | 3 | 30 | 95 |
| 8 | හම්බන්තොට | 6 | අධික වර්ෂාව හා සුළං/ කණ්ඩි කඩා වැටිම් / අකුණු/ ජල ගැලිම් | 107 | 356 | 1 | - | - | - | 78 | - | - | - | - | - |
| 9 | නුවරඑළිය | 2 | නායයෑම් | 11 | 37 | 4 | - | 11 | - | 0 | 1 | 8 | 1 | 9 | 27 |
| 10 | පුත්තලම | 2 | ජල ගැලීම් හා අධික සුළං | 95 | 297 | - | - | - | - | 1 | - | - | - | - | - |
| 11 | ත්‍රිකුණාමලය | 3 | තද වැසි/ තද සුළං | 44 | 150 | - | - | - | - | 12 | - | - | - | - | - |
| 12 | කුරුණෑගල | 1 | ගස් කඩා වැටීම් | 0 | 0 | 1 | - | - | - | 0 | - | - | - | - | - |
| 13 | මොණරාගල | 4 | නායයෑම් අවදානම් | 153 | 511 | - | - | - | 1 | 2 | 130 | 428 | 1 | 21 | 83 |
| 14 | වව්නියාව | 1 | ක්ෂණික ගංවතුර | 03 | 09 | - | - | - | - | 0 | 03 | 09 | | | |
| 15 | මුලතිව් | 3 | තද සුළං / ක්ෂණික ගංවතුර | 162 | 481 | - | 1 | - | - | 1 | 02 | 05 | | | |
| 16 | අනුරාධපුර | 5 | තද වැසි / තද සුළං | 06 | 17 | | | | | 6 | | | | | |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 17 | මාතලේ | 8 | අධික වර්ෂාව හා සුළං/ කණ්ඩි කඩා වැටීම / | 41 | 155 | | | | | 14 | 11 | 39 | | | |
| 18 | මහනුවර | 1 | | 0 | 0 | 0 | 0 | 03 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 19 | අම්පාර | 19 | තද සුළං / ක්ෂණික ගංවතුර | 482 | 1550 | 5 | - | - | - | 18 | - | - | 7 | 107 | 310 |
| 20 | ගම්පහ | 5 | තද වැසි/ තද සුළං / අකුණු / ගස් වැටීම් | 31 | 132 | - | - | - | - | 10 | - | - | - | - | - |
| එකතුව | | 93 | | 1729 | 5893 | 40 | 10 | 21 | 03 | 431 | 137 | 477 | 12 | 148 | 441 |

| සමස්ථ ආපදා විස්තරය Island-wide Total Incidents Summary | සංඛ්‍යාව |
|---|---|
| • බලපෑමට ලක් වූ දිස්ත්‍රික් සංඛ්‍යාව | 20 |
| • බලපෑමට ලක් වූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 93 |
| • බලපෑමට ලක් වූ මුළු පවුල් සංඛ්‍යාව | 1729 |
| • බලපෑමට ලක් වූ මුළු පුද්ගල සංඛ්‍යාව | 5893 |
| • මියයෑම | 40 |
| • තුවාල ලැබූ සංඛ්‍යාව | 10 |
| • අතුරුදහන් | 21 |
| • නිවාස පූර්ණ හානි සංඛ්‍යාව | 03 |
| • නිවාස අර්ධ හානි සංඛ්‍යාව | 431 |
| • සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව | 12 |
| • සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පවුල් සංඛ්‍යාව | 148 |
| • සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පුද්ගල සංඛ්‍යාව | 441 |
| • ඥාති නිවාස වල සිටින මුළු පවුල් සංඛ්‍යාව | 137 |
| • ඥාති නිවාස වල සිටින මුළු පුද්ගල සංඛ්‍යාව | 477 |

## මරණ පිළිබඳ විස්තර (2025.11.17 දින 1800 පැය සිට 2025.11.25 දින 1800 පැය දක්වා)

| අනු අ. | දිස්ත්‍රික්කය | දිනය | ආපදාව | ප්‍රා.ලේ.කො | ස්ත්‍රී/ පුරුෂ භාවය | වයස |
|---|---|---|---|---|---|---|
| 01 | බදුල්ල | 2025.11.17 | සැඩ පහරට ගසාගෙන යාම | වැලිමඩ | ස්ත්‍රී - 1<br>පුරුෂ -1 | අවු. 32<br>අවු. 37 |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **02** | |
| 02 | හම්බන්තොට | 2025.11.21 | සැඩ පහරට ගසාගෙන යාම (ඌරු බොකු ඔය පිටාර ගැලීම) | කටුවන | පුරුෂ -1 | අවු. 55 |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **01** | |
| 03 | කෑගල්ල | 2025.11.22 | ගලක් පෙරලීම (පහළ කඩුගන්නාව) | මාවනැල්ල | පුරුෂ -5<br>ස්ත්‍රී - 1 | අවු.76 , 31 , 60,43,33<br>අවු. 39 |
| | | 2025.11.23 | ගසක් කඩා වැටීම (ත්‍රී රෝද රථයකට) | මාවනැල්ල | පුරුෂ -1 | අවු. 38 |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **07** | |
| **මුළු මරණ එකතුව** | | | | | **10** | |

## මරණ පිළිබඳ විස්තර (2025.11.26 දින සිට 2025.11.27 දින 1800 පැය දක්වා)

| අනු අ. | දිස්ත්‍රික්කය | දිනය | ආපදාව | ප්‍රා.ලේ.කො | ස්ත්‍රී/ පුරුෂ භාවය | වයස |
|---|---|---|---|---|---|---|
| 01 | බදුල්ල | 2025.11.27 | අධික වර්ෂාව සහ නායයෑම් | ලුණුගල | 7 | |
| | | | | පස්සර | 2 | |
| | | | | බදුල්ල | 5 | |
| | | | | කන්දකැටිය | 3 | |
| | | | | සොරණාතොට | 1 | |
| | | | | ඇල්ල | 1 | |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **19** | |
| 02 | කුරුණෑගල | 2025.11.26 | ගසක් කඩා වැටීම (යතුරුපැදියක් මතට) | ඉබ්බාගමුව | පුරුෂ - 1 | අවු. 34 |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **01** | |
| 03 | නුවරඑළිය | 2025.11.27 | නායයෑම් | වලපනේ | 04 | |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **04** | |
| 04 | ගාල්ල | 2026.11.26 | ජල පහරට හසුවීම (ගිං ගඟ) | බද්දේගම | ගැහැණු - 1 | |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **01** | |
| 05 | අම්පාර | 2025.11.27 | ජල පහරට හසුවීම | සයින්දමරුදු | පිරිමි - 01<br>ගැහැණු - 02 | අවු. 62<br>අවු. 59 හා අවු 06 |
| | | | දියේ ගිලීම් | සමන්තුරේ | 1 | |
| | | | ගස් කඩා වැටීම් | තිරුක්කෝවිල් | 1 | |
| **දිස්ත්‍රික් එකතුව** | | | | | **05** | |
| **මුළු මරණ එකතුව** | | | | | **30** | |

**සුරක්ෂිත මධ්‍යස්ථාන පිළිබඳ විස්තර (2025.11.27 දින 1800 පැය දක්වා)**

| අනු අං. | දිස්ත්‍රික්කය | දිනය | ආපදාව | ප්‍රා.ලේ.කො | මධ්‍යස්ථානයේ නම | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| **01** | රත්නපුර | 2025.11.21 | නායයෑමේ අවදානම | කොළොන්න | බොරළුවගේ අයින ග්‍රා.නි. වසමේ ප්‍රජාශක්ති මධ්‍යස්ථානය | 08 | 27 |
| | | 2025.11.24 | තද වර්ෂාව හා ගල්පෙරළීමේ අවදානම | බලංගොඩ | පෙට්ටිගල සිංහල විද්‍යාලය | 08 | 31 |
| | | 2025.11.25 | | | එගොඩ වලේබොඩ විද්‍යාලය | 14 | 37 |
| | **දිස්ත්‍රික් එකතුව (03)** | | | | | **30** | **95** |
| **02** | නුවරඑළිය | 2025.11.21 | නායයෑමේ අවදානම | නුවරඑළිය | ගොරඩිහෙල ග්‍රා.නි වසමේ සංඛගිරි විහාරස්ථානය | 09 | 27 |
| | **දිස්ත්‍රික් එකතුව (01)** | | | | | **09** | **27** |
| **03** | යාපනය | 2025.11.23 | තද සුළං / ක්ෂණික ගංවතුර | චාවකච්චේරිය | J /327 ග්‍රා.නි වසමේ පොක්කඩි GTMS පාසල | 02 | 09 |
| **දිස්ත්‍රික් එකතුව (01)** | | | | | | **02** | **09** |
| **04** | අම්පාර | 2025.11.27 | ගංවතුර | සයින්දමරුදු | අල් හිලාල් විදුහල සයින්දමරුදු | 26 | 54 |
| | | | | කල්මුණේ | මරුතමුවෙයි පුස්තකාලය | 26 | 97 |
| | | | | අඩ්ඩාලච්චේන | නීලමිය ප්‍රා.වි අඩ්ඩාලච්චේන | 06 | 20 |
| | | | | අලයාඩිවෙම්බු | තිරුවලුවර් විදුහල | 11 | 36 |
| | | | | අම්පාර | මිහිඳුපුර | 10 | 27 |
| | | | | සාමපුර | | 20 | 47 |
| | | | | සේනානායකපුර | | 08 | 29 |
| **දිස්ත්‍රික් එකතුව (07)** | | | | | | **107** | **310** |
| **05** | මොණරාගල | 2025.11.27 | ජල ගැලීම | මැදගම | සේනාපති විදුහල | 21 | 83 |
| | **දිස්ත්‍රික් එකතුව (01)** | | | | | **21** | **83** |
| | **මුළු සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව (13)** | | | | | **169** | **524** |

**2025.11.26 දින 1800 පැය සිට 2025.11.27 දින 1800 පැය දක්වා විශේෂ සිදුවීම්**

| අනු.අ. | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ.කො./ ස්ථානය | සිදුවීම |
|---|---|---|---|
| 01 | කොළඹ | සීතාවක | 1. 431/ඊ, කිරිවන්දල දකුණ ග්‍රා. නි වසමේ කාගිල්ස් ෆුඩ්සිටිය අසළ ඉදිරිපිට වතු සමාගමකට අයත් රබර් වත්තක JCB යන්ත්‍රයක් යොදා ගනිමින් රබර් ගස් ගැලවීමේදී අවිස්සාවේල්ල - කොළඹ දුම්රිය මාර්ගයට පස් හා ගල් පෙරළී ඇති අතර 2000 පැය වන විට මාර්ග අවහිරතා ඉවත් කර යථා තත්ත්වයට පත් කරන ලදි. |
| 02 | මාතලේ | දඹුල්ල | 2. ගල්වැටියාව නම් ගමට ගමන් කරනු ලබන කලින් අබලන් තත්තවයේ පැවති පාලමක් සම්පූර්ණයෙන් කඩාගෙන ගොස් ඇත. එම ගම වෙත ගමන් කිරීම සඳහා විකල්ප මාර්ග බවතින බවද දැනුවත් කරන ලදි. |
| | | ගලේවෙල | 3. පැවති වර්ෂාව හේතුවෙන් දඹවටන ග්‍රාම නිලධාරී වසමෙහි නිවාස 40 ක් පමණ ජලයෙන් යටවී ඇති බව වාර්තා විය. |
| 03 | වව්නියාව | වව්නියාව | 1. පවතින අධික වර්ෂාව හේතුවෙන් වව්නියාව නෙදුන්කර්නි රෝහල ජලගැලීමට ලක්ව ඇති අතර රෝගීන් ඇතුලත් කර ගැනීම නවතා ඇති බවත් පොලීසිය හා යුධ හමුදාව දැනුවත් කර ඇති දැනුවත් කරන ලදි. |
| | | වව්නියාව දකුණ | 2.කලුකුන්නම්මඩුව ග්‍රාම නිලධාරී වසමෙහි උපුල් සාමකුමාර යන අයගේ නිවසේ සාමාජිකයින් 06 දෙනෙකු ජලයට හසුවී කොටුවී ඇති බව වාර්තා විය. |
| 04 | කුරුණෑගල | ගල්ගමුව | 1. අඹන්පොල හා ගල්ගමුව අතර 151 කණුව ආසන්නයේ දුම්රිය මාර්ගයට ගසක් වැටී තිබූ අතර එම ගස අඹන්පොල පොලිසියේ නිළධාරින් විසින් ඉවත් කරන ලදි. |
| 05 | බදුල්ල | බදුල්ල | 1. ඉදල්හිගස්හින්න දුම්රිය ස්ථානයට හා තේ කර්මාන්තශාලාවට යන මාර්ගයට ( ප්‍රධාන මාර්ගයක් නොවේ ) පස් කණ්ඩියක් කඩා වැටීම හේතුවෙන් එම මාර්ගය අවහිර වී තිබූ අතර මාර්ග අවහිරතා ඉවත් කර යථා තත්ත්වයට පත් කරන ලදි. |
| | | වැලිමඩ | 2. වැලිමඩ ග්‍රාම නිලධාරී වසමෙහි අඹේවෙල හිලන්විය යන ස්ථානයේ නායයෑම් තත්ත්වයක් හේතුවෙන් ලයිමක නිවාස 03 ක් පස්වලින් යටවී ඇති අතර එහි සිටි පිරිස ගම්වැසියන් විසින් නිරුපද්‍රිතව බේරාගෙන ඇති අතර ඉන් එක් අයෙක් සොයාගැනීමට නොහැකි බව දැනුම් දී ඇත. එම පුද්ගලයා කැප්පෙටිපොල පොලිසිය හා ගම්වාසින් විසින් සොයාගෙන නුවරඑළිය රෝහල වෙත යොමු කර ඇත. |
| | | බදුල්ල | 3. බදුල්ල - මහියංගනය මාර්ගය දුන්හිඳ ඇල්ල අසලින් පස් කඳු කඩා වැටි අවහිර වි ඇත. |
| | | පස්සර | 4. මඩගන්තලාව උතුර ග්‍රාම නිලධාරී වසමෙහි එක් නිවසක් නායගොස් ඇති අතර පුද්ගලයින් දෙදෙනෙකු අතඅරඅදන් වි ඇති බව වාර්තා විය. |
| 06 | මහනුවර | උඩුදුම්බර | 1. මීමුරේ ග්‍රාම නිලධාරී වසමෙහි පුෂ්පේ ඇල, ඇතඹගල්ල නිලමේ නිවස අසළ මාර්ගය පස් කණ්ඩියක් කඩා වැටී අවහිර වී ඇති බව වාර්තා විය. |
| | | පාතහේවාහැට | 2. නුවර - දෙල්තොට ප්‍රධාන මාර්ගයේ තලවතු ඔය හරහා උඩුදෙණිය ප්‍රදේශය සම්පූර්ණයෙන් නායයෑමෙන් අවහිර වී ඇති බව වාර්තා විය. |
| | | හඟවට කෝරලේ | 3. උඩගල්වත්ත ග්‍රාම නිලධාරී වසමෙහි අංක. 06/බී, ලේල්වැල්ල පාර ලිපිනයේ පදිංචි සේනානි සන්ධ්‍යා කුමාරි යන අයගේ නිවස පිටුපස පිහිටි පස් කණ්ඩියක් සමඟ ගසක්ද කඩාගෙන විත් තම නිවසේ මුළුතැන්ගෙය සම්පූර්ණයෙන් යට වී ඇති බවයි. |
| | | හඟවට කෝරලේ | 4. 268 මහකන්ද ග්‍රාම නිලධාරී වසමෙහි පස් කණ්ඩියක් විදුලි කණුවක්ද සමඟින් ගලහා මාර්ගයට කඩා වැටීමේ අවදානමක් පවතින බවයි. |
| | | හාරිස්පත්තුව | 5. අත්තරගම දකුණ ග්‍රාම නිලධාරී වසමෙහි අත්තරගම හරහා ඉදිකර ඇති වේල්ල කැඩී මරංගහතැන්න අතුරු මාර්ගය අවහිර වි ඇත. |
| | | පාතහේවාහැට | 6. මහමැදගම පල්ලේගම ග්‍රාම නිලධාරී වසමෙහි කුරුවක හංදිය අසල පහල පංසල පාර නිවසකට පස් කණ්ඩියක් කඩා වැටීම හේතුවෙන් එම නිවසේ පුද්ගලයින් දෙදෙනෙකු අතුරුදන්ව ඇති අතර ඔවුන් සොයා ගැනීමට යුද්ධ හමුදා සහාය ලබා දීමට කටයුතු කරන ලදි.<br>7. කොලබිස්ස දකුණ ග්‍රා.නි. වසමේ කොලබිස්ස දෙල්තොට මාර්ගයට නායයෑමෙන් ගසක් කඩා වැටී අවහිරවී ඇත. |
| | | තෙල්දෙණිය | 1. පැවති වර්ෂාව සමඟ 21 ඒ ඉහල ගොඩමුන්න මකුළුගමුව ලිපිනයේ පදිංචි නිවස සම්පූර්ණයෙන් කැඩී ගොස් ඇත. |

| | | | |
|---|---|---|---|
| | | උඩුදුම්බර | 8. ගම්ගොඩ ග්‍රාම නිලධාරී වසමෙහි නිවසක් මතට පස් කන්දක් කඩා වැටී ඇති අතර එම නිවසේ සිටි අය මුදවා ගැනීමට යුද්ධ හමුදා සහාය ලබා දීමට කටයුතු කරන ලදි. |
| 07 | නුවරඑළිය | වලපනේ | 1. 504/ඒ දිගන්තලාව ග්‍රාම නිලධාරී වසමෙහි හයිපෝස් සිට වලපනේ දක්වා දිවෙන මහඋඵව මාර්ගයට පස් කණ්ඩියක් කඩා වැටීමෙන් අවහිර වී ඇත. |
| | | | 2. වලපනේ - නුවරඑළිය මාර්ගයේ නාරංතලාව හංදියේ නිවසක් නායගොස් ඇති බව වාර්තා විය. |
| | | නුවරඑළිය | 1. නුවරඑළිය නගරයේ ශාන්ත ඇන්ඩෲස් අසල නිවසක් නායගොස් ඇති බව වාර්තා විය. |
| | | | 2. මධ්‍යම නුවරඑළිය උඩුපුස්සැල්ලාව මාර්ගයේ හාවේලිය යන ප්‍රදේශයේ නිවාස කිහිපයක් ජලයෙන් යටවී ඇති බව වාර්තා විය. |
| | | | 3. නානුඔය හා ග්‍රේට් වෙස්ටර්න් දුම්රිය මාර්ගයට පස් හා ගල් වැටී අවහිර වී ඇත. එම බාධාවන් ඉවත්කරමින් තිබෙන අතර දුම්රිය ගමනාගමනය තාවකාලිකව නානුඔය දක්වා පමනක් සිදු කරනු ලබයි |
| 08 | පොළොන්නරුව | | පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මනම්පිටිය - ගල්ලැල්ල අතර මාර්ගයේ කොටසක් බර වාහන සඳහා පමණක් විවෘත කර ඇත. |
| 09 | මොණරාගල | මැදගම | 1. බැදියාව ග්‍රාම නිලධාරී වසමෙහි පවුල් 03 ක පුද්ගලයින් 10 පමණ කොටුවී සිටි අතර මැදගම පොලාසාය මගින් ඔවුන් මුදවා ගන්නා ලදි. |
| | | | 2. කන්දවින්න ග්‍රාම නිලධාරී වසමෙහි පවුල් 09 ක් ගංවතුරට කොටුවී ඇති අතර ඔවුන් මුදවා ගැනීමට යුද්ධ හමුදා සහාය ලබා දීමට කටයුතු කරන ලදි. |

## ගල් ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය **2025.11.26** දින **1145** පැයට **(2025.11.28** දින **1145** පැය දක්වා**)**

2025.11.28 දින පෙ.ව. 11.45 දක්වා වලංගුවේ.
Valid till 11.45 AM on 28th of November 2025

Time :- 11.45 AM
වේලාව :- පෙ.ව. 11.45

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක - 01**
**Flood Warning Message : Number - 01**

වර්ණය - රතු
Colour – Red

### ගල් ඔය ද්‍රෝණිය - Gal Oya Basin

**ගල් ඔය ද්‍රෝණියේ ඉහළ සහ මධ්‍යම ධාරා ප්‍රදේශවලට අධික වර්ෂාපතනයක් ලැබී ඇති බැවින් අම්පාර ඉඟිනියාගල සේනානායක සමුද්‍රයේ ජල ධාරිතාවය මේ වන විට ජලාශයේ රඳවාගත හැකි උපරිම ජල ධාරිතාව දක්වා ලඟා වෙමින් පවතී. එමෙන්ම එම ප්‍රදේශයට පසුගිය පැය 24 තුළ ලැබුණු දැඩි වර්ෂාපතනය හේතුවෙන් ගල් ඔය ගඟෙහි සේනානායක සමුද්‍රයට පහළ ප්‍රදේශය ගංවතුර තත්ත්වයකට ළඟා වී ඇති අතර ඉදිරියේදී සේනානායක සමුද්‍රයේ පිටවාන් දොරටු ද විවෘත කිරීමට සිදු විය හැකි බැවින් ගල් ඔය ගඟෙහි ජල මට්ටම ඉහල යනු ඇත. එබැවින් ගංවතුර නිසා සිදුවිය හැකි අනතුරු අවම කරගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගල් ඔය නිම්නයෙහි පහල ප්‍රදේශවල වෙසෙන මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. විශේෂයෙන් දමන, අම්පාර, එරගම, අඩ්ඩලච්චේනායි, සමන්තුරෙයි, නින්දවූර්, කරතිව්, සයින්දමරුදු, කල්මුනේ, නාවිතන්වෙලි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සහ ඔලුවිල් අග්නිදිග විශ්ව විද්‍යාල පරිශ්‍රය ආශ්‍රිත පහත් බිම්වල වෙසෙන ජනතාව සහ එම ප්‍රදේශ හරහා ගමන් කරන රථ වාහන රියදුරන් සහ මගීන් දැඩි විමසිල්ලෙන් පසුවිය යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**මුන්දෙනි ආරු ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.26 දින 1000 පැයට (2025.11.28 දින 1000 පැය දක්වා)**

**Time :- 10.00 AM**
**වේලාව :- පෙ.ව. 10.00**

2025.11.28 දින පෙ.ව 10.00 දක්වා වලංගුවේ.
Valid till 10.00 AM on 28th of November 2025

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - **01** | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number - 01** | Colour – Amber |

## මුන්දෙනි ආරු ද්‍රෝණිය - Mundeni Aru Basin

අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන් හි ඇතැම් ප්‍රදේශවලට ඊයේ රාත්‍රියේ සිට ලැබෙන අධික වර්ෂාපතනය හේතුවෙන් මුන්දෙනි ආරු ද්‍රෝණියේ අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවුපර්ත්තු හා කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් මුන්දෙනි ආරු ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවලට මෙතැන් සිට ඉදිරි පැය 48ක් දක්වා වූ කාලය තුළ ගංවතුර තත්ත්වයක් ඇතිවීමේ අවධානමක් පවතී. එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.

**මාදුරු ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 1430 පැයට (2025.11.29 දින 1430 පැය දක්වා)**

**Time :- 2.30 PM**
**වේලාව :- ප.ව.2.30**

2025.11.29 දින ප.ව 2.30 දක්වා වලංගුවේ.
Valid till 2.30 PM on 29th of November 2025

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - **02** | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Amber |

## මාදුරු ඔය ද්‍රෝණිය - Maduru Oya Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.26 දින පෙ.ව.8.30 ට මාදුරු ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.

**යාන් ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.26 දින 1130 පැයට (2025.11.28 දින 1130 පැය දක්වා)**

2025.11.28 දින පෙ.ව.11.30 දක්වා වලංගුවේ.
Valid till 11.30 AM on 28th of November 2025

Time :- 11.30 AM
වේලාව :- පෙ.ව. 11.30

ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක - 01
**Flood Warning Message : Number - 01**

වර්ණය - ඇම්බර්
Colour – Amber

## යාන් ඔය ද්‍රෝණිය - Yan Oya Basin

යාන් ඔය ද්‍රෝණියේ ඉහළ සහ මධ්‍යම ධාරා ප්‍රදේශවලට අධික වර්ෂාපතනයක් ලැබී ඇති නිසා යාන් ඔය පහල ප්‍රදේශවලට ඇතිවිය හැකි ගංවතුර තත්ත්වය හේතුවෙන් සිදුවිය හැකි අනතුරු අවම කරගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස යාන් ඔය පහල ප්‍රදේශවල වෙසෙන මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. විශේෂයෙන් **කුච්චවේලි, පදවි ශ්‍රී පුර, පදවිය, කැබිතිගොල්ලෑව, ගෝමරන්කඩවල, හොරොව්පතාන, මොරවැව, කහටගස්දිගිලිය හා ගලෙන්බිඳුණුවැව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල යාන්ඔය ආශ්‍රිත පහත් බිම්වල** වෙසෙන ජනතාව සහ එම ප්‍රදේශ හරහා ගමන් කරන රථ වාහන රියදුරන් සහ මගීන් දැඩි විමසිල්ලෙන් පසුවිය යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**මහවැලි ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 1300 පැයට (2025.11.28 දින 1300 පැය දක්වා)**

2025.11.28 දින ප.ව 1.00 දක්වා වලංගුවේ.
Valid till 1.00 PM on 28th of November 2025

**Time :- 1.00 PM**
**වේලාව :- ප.ව. 1.00**

ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක - **04**
**Flood Warning Message : Number - 04**

වර්ණය - රතු
Colour – Red

## මහවැලි ගඟ ද්‍රෝණිය - Mahaweli River Basin

මහවැලි ගඟෙහි ධාරා ප්‍රදේශවලට ඊයේ රාත්‍රියේ සිට ලැබෙන වර්ෂාපතනය හේතුවෙන් මහවැලි ගංගා ද්‍රෝණියේ ප්‍රධාන ජලාශ බොහොමයක් වාන් දැමීම ආරම්භ කොට ඇත. එමනිසා **කින්නියා, මුතූර්, කන්තලේ, සේරුවිල, වැලිකන්ද, මැදිරිගිරිය, ලංකාපුර, තමන්කඩුව, මිනිපේ, විල්ගමුව, දෙහිඅත්තකණ්ඩිය, මහියංගනය හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට** අයත් මහවැලි ගඟ ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවලට මෙතැන් සිට ඉදිරි පැය **48**ක කාලය තුළ මහ ගංවතුර තත්ත්වයක් ඇතිවීමේ හැකියාවක් පවතී. තවද **මඩකලපුව - පොළොන්නරුව මාර්ගය ගල්ලැල්ල ප්‍රදේශයෙන්ද, සෝමාවතී රජමහා විහාර පිවිසුම් මාර්ගයද, සෝමාවතී රජමහා විහාරය** අවට ප්‍රදේශයේද ගංවතුර තත්වය තවදුරටත් ඉහළ යාමේ අවධානමක් ඇත. එසේම එම ප්‍රදේශවල මහවැලි ගඟට ආසන්නව පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි මහ ගංවතුර තත්වයෙන් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.

**හැඩ ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.26 දින 1130 පැයට (2025.11.28 දින 1130 පැය දක්වා)**

**Time :- 3.30 PM**
**වේලාව :- ප.ව. 3.30**

2025.11.28 දින ප.ව 3.30 දක්වා වලංගුවේ.
Valid till 3.30 PM on 28th of November 2025

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 01 | වර්ණය - ඇම්බර් | |
| **Flood Warning Message :** | **Number - 01** | Colour – Amber | |

## හැඩ ඔය ද්‍රෝණිය - Heda Oya Basin

මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්කයන් හි ඇතැම් ප්‍රදේශවලට ඊයේ රාත්‍රියේ සිට ලැබෙන අධික වර්ෂාපතනය හේතුවෙන් හැඩ ඔය ද්‍රෝණියේ මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් හැඩ ඔය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවලට මෙතැන් සිට ඉදිරි පැය 48ක් දක්වා වූ කාලය තුළ ගංවතුර තත්ත්වයක් ඇතිවීමේ හැකියාවක් පවතී. එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.

**කුඹුක්කන් ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 0300 පැයට (2025.11.27 දින 1500 පැය දක්වා)**

2025.11.27 දින ප.ව 3.00 දක්වා වලංගුවේ.
Valid till 3.00 PM on 27th of November 2025

**Time :- 3.00 AM**
**වේලාව :- පෙ.ව. 3.00**

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 02 | වර්ණය - රතු | |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Red | |

## කුඹුක්කන් ඔය ද්‍රෝණිය - Kumbbukan Oya Basin

කුඹුක්කන් ඔය ද්‍රෝණියේ ධාරා ප්‍රදේශවලට ඊයේ රාත්‍රියේ සිට ලැබෙන අධික වර්ෂාපතනය හේතුවෙන් මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නක්කල, කුඹුක්කන, මාදුරුකැටිය යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවලට මෙන්ම බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඔක්කම්පිටිය හා ගාමිණීපුර යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවලට ද අයත් කුඹුක්කන් ඔය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවලට මෙතැන් සිට ඉදිරි පැය 12 ක කාලය තුළ අධි ගංවතුර තත්ත්වයක් ඇතිවීමේ හැකියාවක් පවතී. එබැවින් එම ප්‍රදේශවල කුඹුක්කන් ඔයට ආසන්නව පදිංචි මහජනතාව සහ එම ප්‍රදේශ හරහා ගමන් කරන රථ වාහන රියදුරන් සහ මගීන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.

## දැදුරු ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 0400 පැයට (2025.11.29 දින 0400 පැය දක්වා)

2025.11.29 දින පෙ.ව. 11.30 දක්වා වලංගුවේ.
Valid till 11.30 a.m. on 29th of November 2025

**වේලාව / Time } පෙ.ව. 11.30 / 11.00 a.m.**

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක 05** වර්ණය - රතු
**Flood Warning Message : Number 05** Colour – Red

### දැදුරු ඔය ද්‍රෝණිය - Deduru Oya Basin

දැදුරු ඔය ද්‍රෝණියේ ඉහළ හා මධ්‍ය ප්‍රදේශවලට ඇදහැලෙමින් පවතින සැලකිය යුතු වර්ෂා තත්ත්වය හා දැදුරු ඔය **ජලාශයේ පිටවාන් දොරටු මඟින් මේ වනවිටත් තත්පරයට ඝණ අඩි 66,200 ක් තරම් සීඝ්‍රතාවයකින්** දැදුරු ඔයට ජලය මුදාහරිමින් පවතී. එම තත්ත්වය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජලමාපකවල කියවීම් අනුව දැදුරු ඔය **ද්‍රෝණියේ පිහිටි වාරියපොළ, නිකවැරටිය, මහව, කොබෙයිගනේ, බිංගිරිය, පල්ලම, ආරච්චිකට්ටුව සහ රස්නායකපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් දැදුරු ඔය ද්‍රෝණියේ පහළ නිම්නයේ ප්‍රදේශවලට පවතින ගංවතුර තත්ත්වය අධි ගංවතුර තත්ත්වයක් දක්වා වර්ධනය වන බවට අනතුරු අඟවනු ලැබේ. විශේෂයෙන්ම දැදුරු ඔය ද්‍රෝණියේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශයන්හි දැදුරු ඔය ද්‍රෝණියේ පහළ නිම්නයේ ප්‍රදේශවලට පවතින ගංවතුර තත්ත්වය අධි ගංවතුර තත්ත්වයක් දක්වා ඉදිරි පැය කිහිපය තුළ වර්ධනය වන බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් ඉතා දැඩි සැළකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රවේශ මාර්ග හරහා ගමන් ගන්නා වාහන පදවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. තවද මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ග්‍රාම නිලධාරි කොට්ඨාශ |
|---|---|
| ආරච්චිකට්ටුව | වීරකුමන්දලුව |
| | මුක්කන්දලුව |
| | දෙමටපිටිය |
| | දිගන්වැව |
| | බංගදෙනිය |
| | කරුකුපනේ |
| හලාවත | දැදුරුඔය |
| | නරියාගම උතුර |
| | නරියාගම දකුණ |
| | කිස්සෝගම |
| | පරප්පමුල්ල |
| | මාතුවන්ගම නැගෙනහිර |
| | මාතුවන්ගම බටහිර |
| බිංගිරිය | බින්ගිරිය |
| | උරපොත්ත |
| | පහළ ගල්වැව |
| | බ්‍රාහ්මණයාගම |
| | මුකලන්හේන |

## බදුලු ඔය උප ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 1530 පැයට (2025.11.28 දින 1530 පැය දක්වා)

2025.11.28 දින ප.ව. 3.30 දක්වා වලංගුවේ.
Valid till 3.30 PM on 28th of November 2025

**Time :- 3.30 PM**
**වේලාව :- ප.ව. 3.30**

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක - 05** වර්ණය - ඇම්බර්
**Flood Warning Message : Number - 05** Colour – Amber

### මහවැලි ගංගා ද්‍රෝණියේ බදුලු ඔය උප ද්‍රෝණිය
### Mahaweli River Basin Badulu Oya Sub Basin

බදුලු ඔය ධාරා ප්‍රදේශවලට ඊයේ රාත්‍රියේ සිට ලැබෙන වර්ෂාපතනය හේතුවෙන් **බදුලු ඔය උප ද්‍රෝණියේ බදුල්ල හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් බදුලු ඔය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවලට දැනට පවතින ගංවතුර තත්ත්වයෙ ඉදිරි පැය 24ක කාලය තුළද පවතිනු ඇති බවට මෙයින් අනතුර අඟවනු ලැබේ. එසේම එම ප්‍රදේශවල බදුලු ඔයට ආසන්නව පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**කලා ඔය උප ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 0130 පැයට (2025.11.29 දින 0130 පැය දක්වා)**

වේලාව :- පෙ.ව. 1.30
Time :- 1.30 AM

2025.11.29 දින .පෙ.ව. 1.30 දක්වා වලංගුවේ.
Valid till 1.30 am on 29th of November 2025

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක 01 | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number 01** | Colour – Amber |

## කලා ඔය ද්‍රෝණිය - Kala Oya Basin

කලා ඔය ද්‍රෝණියේ ඉහළ හා මධ්‍ය ප්‍රවේශවලට ඇදහැලුණු සැලකිය යුතු වර්ෂාපතනය හේතුවෙන් කලා ඔයෙහි ජල මට්ටම ගංවතුර මට්ටමට ආසන්නව පවතී. තවද රාජාංගනය ජලාශයේ පිටවාන් දොරටු විවෘත කර මේ වනවිට තත්පරයට ඝණ අඩි 14,370 ක් තරම් සීග්‍රතාවයකින් කලා ඔයට ජලය මුදාහරිමින් පවතී. එම වනවිට ජලාශයට ලැබෙන ජල ධාරිතාව අනුව මෙම ප්‍රමාණය ඉදිරියේදී තව දුරටත් වැඩි කිරීමට සිදුවිය හැකිය. මේ තත්ත්වය මත ද්‍රෝණියේ පිහිටි රාජාංගනය, නොච්චියාගම, වනාතවිල්ලුව සහ කරුවලගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් ගංවතුර නිම්නයේ පහළ ප්‍රදේශවලට ගංවතුර තත්වයක් ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සැළකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රවේශ වල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන්ගෙන් හා මගීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. තවද මේ සම්බන්ධයෙන් අවශය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශවලින් ද ඉල්ලා සිටිනු ලැබේ.

**කැළණි ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 0300 පැයට (2025.11.28 දින 0300 පැය දක්වා)**

**Time :- 3.00 AM**
වේලාව :- පෙ.ව. **3.00**

2024.11.28 දින පෙරවරු 3.00 දක්වා වලංගුවේ.
Valid till 3.00 AM on 28th of November 2024

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක 01 | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number 01** | Colour – Amber |

## කැළණි ගඟ ද්‍රෝණිය - Kelani River Basin

කැළණි ගඟ ද්‍රෝණියේ ඉහළ ධාරා ප්‍රදේශවලට සැළකියයුතු වර්ෂාපතනයක් ලැබී ඇත. එම වර්ෂා තත්ත්වය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කැළණි ගඟ ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංගා ජල මාපකවල ජල මට්ටම් විශ්ලේෂණය අනුව මෙතැන් සිට ඉදිරි පැය **24** ක කාලය තුළ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කැළණි ගංගා නිම්නයේ පහත්බිම් ප්‍රදේශවලට සුළු ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා වාහන පදවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**මහ ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 0800 පැයට (2025.11.29 දින 0800 පැය දක්වා)**

වේලාව :- පෙ.ව. 8.00
Time :- 8.00 AM

2025.11.29 දින .පෙ.ව. 8.00 දක්වා වලංගුවේ.
Valid till 8.00 am on 29th of November 2025

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක **03** | වර්ණය - රතු | |
| **Flood Warning Message :** | **Number 03** | Colour – Red | |

## මහ ඔය ද්‍රෝණිය - Maha Oya Basin

මහ ඔය ද්‍රෝණියේ ධාරා ප්‍රදේශවලට මේ වන විට ලැබෙමින් පවතින අධික වර්ෂාපතනය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් මහ ඔය ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංගා ජල මාපකවල ජල මට්ටම් විශ්ලේෂණය අනුව මහ ඔය නිම්නයේ පහත්බිම් ප්‍රදේශවලට අධි ගංවතුර තත්ත්වයක් ඉදිරි පැය 48 තුළ ඇතිවිය හැකි බවට මෙයින් අනතුරු අඟවනු ලැබේ. එම කාලය තුළ අලව්ව, දිවුලපිටිය, මීරිගම, පන්නල, වෙන්නප්පුව, මීගමුව, කටාන, නාරම්මල(මරදගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාශය) සහ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් මහ ඔය නිම්නයේ පහත්බිම් ප්‍රදේශවලට අධි ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි ය. මේ තත්ත්වය සම්බන්ධයෙන් ඉතා දැඩි සැලකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන්ගෙන් සහ මගීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**නිල්වලා ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 1230 පැයට (2025.11.29 දින 1230 පැය දක්වා)**

Time :- 12.30 AM
වේලාව :- පෙ.ව12.00

2025.11.29 දින පෙ.ව. 12.30 දක්වා වලංගු වේ.
Valid till 12.30 AM on 29th of November 2025

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - **04** | වර්ණය - ඇම්බර් | |
| **Flood Warning Message :** | **Number - 04** | Colour – Amber | |

## නිල්වලා ගඟ ද්‍රෝණිය - Nilwala Ganga Basin

නිල්වලා ගංගා ද්‍රෝණියේ ධාරා ප්‍රදේශයන්ට ලැබෙමින් පවතින වර්ෂාපතනය හා ගංගා ද්‍රෝණියේ ඇති ජලමාපකවල දත්තයන් සලකා බැලීමේදී දැනට පවතින ගංවතුර තත්වය පහළ ප්‍රදේශ වලදී තව දුරටත් සුළු වශයෙන් වැඩි වෙනු ඇත. එම නිසා ගංවතුර තත්ත්වය ගංගා ද්‍රෝණියේ පහළ ප්‍රදේශවල ඇතැම් ස්ථානවල තවදුරටත් වර්ධනය විය හැකි බැවින් මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.21 දින ප.ව. 11.00 ට නිල්වලා ගඟ ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය **48** සඳහා ද දීර්ඝ කරනු ලැබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා වැටී ඇති මාර්ග වල ( විශේෂයෙන් අතුරු මාර්ග වල ) ගමන් ගන්නා වාහන පදවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**මල්වතු ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 0600 පැයට (2025.11.29 දින 0600 පැය දක්වා)**

**Time :- 1.30 PM**
**වේලාව :- ප.ව. 1.30**

2025.11.28 දින ප.ව. 1.30 දක්වා වලංගුවේ.
Valid till 1.30 PM on 28th of November 2025

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 02 | වර්ණය - රතු | |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Amber | |

## මල්වතු ඔය ද්‍රෝණිය - Malwathu Oya Basin

මල්වතු ඔය ද්‍රෝණියේ ධාරා ප්‍රදේශවලට පසුගිය දින කිහිපයක සිට ලැබෙන අධික වර්ෂාපතනය හේතුවෙන් **වෙන්ගලචෙඩ්ඩිකුලම්, මඩු, මුසාලෙ, නැනඩ්ඩාන් මහවිලච්චිය, නුවරගම්පලාත මධ්‍යම, නුවරගම්පලාත නැගෙනහිර, නාච්චාදූව** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ගංවතුර නිම්නයේ පහළ ප්‍රදේශ වලට **මහ ගංවතුර තත්ත්වයක්** ඇතිවිය හැකි අතර ඉදිරියේදී මෙම ජලමට්ටම තවත් ඉහල යා හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සැළකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශ වල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන්ගෙන් හා මගීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. තවද මේ සම්බන්ධයෙන් **අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**මී ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.27 දින 1130 පැයට (2025.11.28 දින 1130 පැය දක්වා)**

**Time :- 11.30 A.M**
වේලාව :- **පෙ.ව. 11.30**

2025.11.28 දින පෙ.ව. 11.30 දක්වා වලංගුවේ.
Valid till 11.30 AM on 28th of November 2025

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 01 | වර්ණය - ඇම්බර් | |
| **Flood Warning Message :** | **Number - 01** | Colour – Amber | |

## මී ඔය ද්‍රෝණිය - Mee Oya Basin

මී ඔය ද්‍රෝණියේ ධාරා ප්‍රදේශවලට ඊයේ රාත්‍රියේ සිට ලැබෙන අධික වර්ෂාපතනය හේතුවෙන් **ගල්ගමුව, අඹන්පොල, ආනමඩුව, නවගත්තේගම, මහකුඹුක්කඩවල, කරුවලගස්වැව, පුත්තලම, වනාතවිල්ලුව** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් මී ඔය නිම්නයේ පහළ ප්‍රදේශ වලට ප්‍රදේශවලට මෙතැන් සිට ඉදිරි පැය **12** ක කාලය තුළ **සුළු ගංවතුර තත්ත්වයක්** ඇතිවිය හැකි අතර ඉදිරියේදී මෙම ජලමට්ටම තවත් ඉහල යා හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සැළකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශ වල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන්ගෙන් හා මගීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. තවද මේ සම්බන්ධයෙන් **අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

## ශ්‍රී ලංකාව ආශ්‍රිතව පවතින ගැඹුරු පීඩන අවපාතය පිළිබඳ අනතුරු ඇඟවීම් නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**


2025 නොවැම්බර් මස 28 වන දින පෙ.ව. 8.30 දක්වා වලංගු වන පරිදි

2025 නොවැම්බර් මස 27 වන දින ප.ව. 1.00 ට නිකුත් කරන ලදී.

### ගොඩබිම ප්‍රදේශය සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා

**අවධානයෙන් සිටින්න!**

**ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් පැවති පීඩන අවපාතය මේ වන විට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී මඩකලපුව සිට 120 km ක් ගිනිකොණ දෙසින්, අක්ෂාංශ 6.7°N සහ දේශාංශ 82.1°E ආසන්නයේ කේන්ද්‍රගතව වී ඇත. එය උතුරට බරව වයඹ දෙසට ගමන් කරමින් ඉදිරි පැය 12 තුළ සුළි කුණාටුවක් දක්වා තවදුරටත් වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත.**



**ගොඩබිම ප්‍රදේශය සඳහා :**


**මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් දිවයිනේ පවතින තද වැසි සහ තද සුළං තත්ත්වය ඉදිරි දින කිහිපයේදීත් බලාපොරොත්තු වේ.**

**දිවයිනේ බොහෝ ප්‍රදේශවල නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.**

උතුරු, උතුරු-මැද, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් ඇතැම් ස්ථානවලට **මි.මී. 200** ට වැඩි ඉතා තද වැසි සහ, සබරගමුව සහ බස්නාහිර පළාත්වලත් බදුල්ල සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට **මි.මී. 150** ට වැඩි ඉතා තද වැසි ඇති විය හැක. දිවයිනේ සෙසු ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට **මි.මී. 100** ට වැඩි තද වැසි ඇති විය හැක.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල හමන **පැ.කි.මී. (60-70)** දක්වා වන ඉතා තද සුළං සමඟ විටින් විට හමන **පැ.කි.මී. 80** දක්වා වන ප්‍රහාරාත්මක සුළං ඇතිවිය හැක.

**තද වැසි සහ තද සුළං මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**




**ගොඩබිම ප්‍රදේශය සඳහා:**

**සිදුවිය හැකි හානි**

- කඳුකර ප්‍රදේශ වල (විශේෂයෙන් නාය යාම් අවධානම සහිත ප්‍රදේශ වල) සහ ගංගා ආශ්‍රිතව පහත් බිම් වල ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.
- කඳුකර ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.
- පැල්පත්වලට හා තාවකාලික ඉදි කිරීම්වලට හානි වීම .
- වහලවල ඇති තහඩු උළු ආදිය ගැලවී යාම.
- විදුලි සහ දුරකථන රැහැන් වලට හානි සිදුවිය හැක.
- ගස්වල අතු කැඩීම් සහ මාර්ග අසල ඇති විශාල ගස් ගැලවී යා හැක.
- වී වගා බිම්වලට,කෙසෙල්, පැපොල් වැනි පළතුරු වගාවන් වලටද හානි සිදුවිය හැක.
- වරාය ආශ්‍රිතව නවතා /රඳවා ඇති යාත්‍රා අංගන වලට හානි වීම
- ක්ෂණික ගංවතුර තත්ත්වයන් ඇතිවිය හැක
- වෙරළාසන්න පහත් ගොඩබිම් ප්‍රදේශ මුහුදු ජලයෙන් යටවිය හැක.

# තද සුළං, තද වැසි සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
ඉදිරි පැය 24 සඳහා වලංගු වන පරිදි
**2025 නොවැම්බර් මස 26 දින ප.ව. 5.30 ට නිකුත් කරන ලදී.**

---

## බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා, සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව ධීවර සහ නාවුක කටයුතුවල යෙදෙන ප්‍රජාව සඳහා.

**සැලකිලිමත් වන්න !**

### 1.දිවයින වටා මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව ධීවර සහ නාවුක කටයුතුවල යෙදෙන ප්‍රජාව සඳහා

**ශ්‍රී ලංකාවට ආසන්නව, ගිනිකොණ දෙසින් පවතින අඩු පීඩන කලාපය ඉදිරි පැය 24 තුළ තවදුරටත් ක්‍රමයෙන් පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙමින් උතුරට බරව වයඹ දෙසට ගමන් කිරීමට හැකියාවක් පවතී. නොවැම්බර් 26 දින සිට නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.**

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (60-70)** පමණ දක්වා ඉහළ යා හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට **රළු හෝ ඉතා රළු** විය හැක.

පුත්තලම සිට කොළඹ, ගාල්ල, හම්බන්තොට, මඩකලපුව සහ ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස **මීටර් (2.5 – 3.5)** ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී. (මෙය ගොඩබිමට එන රළ උස නොවේ).

### 2.බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා

**"සෙන්යාර්" සුළි කුණාටුව මැලක්කා සමුද්‍ර සන්ධිය සහ ඒ ආශ්‍රිත ඊසානදිග ඉන්දුනීසියාවේ අක්ෂාංශ 4.9°N සහ දේශාංශ 97.8°E අසල වෙරළබඩ ප්‍රදේශ හරහා අද (2025 නොවැම්බර් 26 වන) දින 0300 UTC පමණ වන විට කේන්ද්‍රගතව පැවතුනි.එය බටහිර-නිරිත දෙසට ගමන් කර 2025 නොවැම්බර් 27 වන දින 0000UTC දක්වා සුළි කුණාටුවේ තීව්‍රතාවය පවත්වා ගැනීමට බොහෝ දුරට ඉඩ ඇත.**

**පහත සිතියමේ "Advisory" කාණ්ඩය යටතේ ලකුණු කර ඇති මුහුදු ප්‍රදේශවල ගිගුරුම් සහිත තද වැසි ඇතිවන අතර, සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා වැඩි වීමත් සමග එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.**

**පහත සිතියමේ "Warning" කාණ්ඩය යටතේ ලකුණු කර ඇති මුහුදු ප්‍රදේශවල ගිගුරුම් සහිත තද වැසි ඇතිවන අතර, සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 70 දක්වා වැඩි වීමත් සමග එම මුහුදු ප්‍රදේශ ඉතා රළු වේ. එබැවින් මෙම මුහුදු ප්‍රදේශවල, නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ. මේ වනවිට එම ප්‍රදේශයේ ධීවර කටයුතුවල යෙදී සිටී නම් එම මුහුදු ප්‍රදේශ වලින් ඉවත්වන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.**

**ධීවර සහ නාවික ප්‍රජාවන්, මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

## කාලගුණ නිවේදනය 2025.11.27 දින 1600 පැයට

**ඉදිරි පැය 36 සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය**
**2025 නොවැම්බර් මස 27 දින සවස 04.00 ට නිකුත් කරන ලදි.**

**ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් පැවති පීඩන අවපාතය මේ වන විට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී මඩකලපුව සිට 120 km ක් ගිනිකොණ දෙසින්, අක්ෂාංශ 6.7°N සහ දේශාංශ 82.1°E ආසන්නයේ කේන්ද්‍රගතව වී ඇත. එය උතුරට බරව වයඹ දෙසට ගමන් කරමින් ඉදිරි පැය 12 තුළ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත.**

**මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් දිවයිනේ පවතින තද වැසි සහ තද සුළං තත්ත්වය ඉදිරි දින කිහිපයේදීත් බලාපොරොත්තු වේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**දිවයිනේ බොහෝ ප්‍රදේශවල අහස වලාකුළින් බරව පවතින අතර විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.**

උතුරු, උතුරු-මැද, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් ඇතැම් ස්ථානවලට **මි.මී. 200 ට වැඩි ඉතා තද වැසි** සහ, සබරගමුව සහ බස්නාහිර පළාත්වලත් බදුල්ල සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට **මි.මී. 150** ට වැඩි **ඉතා තද වැසි** ඇති විය හැක. දිවයිනේ සෙසු ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට **මි.මී. 100** ට වැඩි **තද වැසි** ඇති විය හැක.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල හමන **පැ.කි.මී. (60-70)** දක්වා වන **ඉතා තද සුළං** සමඟ විටින් විට හමන **පැ.කි.මී. 80** දක්වා වන **ප්‍රභාරාත්මක සුළං** ඇතිවිය හැක.

**තද වැසි සහ තද සුළං මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ නිවේදනය 2025.11.27 දින 1400 පැයට

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2025 නොවැම්බර් මස 27 දින ප.ව. 2.00 ට නිකුත් කරන ලදි.**

| |
|---|
| **ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් පැවති පීඩන අවපාතය මේ වනවිට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී මඩකලපුව සිට 120 km ක් ගිනිකොණ දෙසින්, අක්ෂාංශ 6.7°N සහ දේශාංශ 82.1°E ආසන්නයේ කේන්ද්‍රගතව වී ඇත. එය උතුරට බරව වයඹ දෙසට ගමන් කරමින් ඉදිරි පැය 12 තුළ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත.**<br><br>**නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ. ධිවර සහ නාවික කටයුතුවල යෙදෙන ප්‍රජාව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන ඉදිරි නිවේදන පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.** |
| **වැසි තත්ත්වය:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශ වල ඉතා තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි පැවතිය හැක. |
| **සුළඟ:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන සිට උතුර දක්වා වන දිශා වලින් හමා එයි. දිවයින වටා වන මුහුදු ප්‍රදේශ වල සුළගේ වේගය පැ.කි.මී. **(60-70)** ක පමණ ඉතා තද සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී. **80** දක්වා වන ප්‍රභාරාත්මක සුළං ඇතිවිය හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වේ.<br><br>පුත්තලම සිට කොළඹ, ගාල්ල, හම්බන්තොට, මඩකලපුව සහ ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස මීටර් **(3.0 – 4.0)** ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී. (මෙය ගොඩබිමට එන රළ උස නොවේ).<br><br>ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක. |

## 2025.11.27 දින 1530 පැයට ප්‍රධාන ගංගා ආශ්‍රිත ජල මට්ටම්

### Islandwide Water Level & Rainfall Situation in Major Rivers

DATE : 27-Nov-2025 TIME : 3:30 PM

| River Basin | Tributory/River | Ganging Station | | | | | Water Level at 2:00 pm | Water Level at 3:00 pm | Remarks | Water Level Rising or Falling | 6 Hr RF in mm at 3.00 pm |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Station | Unit | Alert Level | Minor Flood Level | Major Flood Level | | | | | |
| Kelani Ganga (RB 01) | Kelani Ganga | Nagalagam Street | ft | 4.00 | 5.00 | 7.00 | 2.70 | 2.90 | Normal | | - |
| | Kelani Ganga | Hanwella | m | 7.00 | 8.00 | 10.00 | 5.72 | 5.88 | Normal | | 11.8 |
| | Kelani Ganga | Glencourse | m | 15.00 | 16.50 | 19.00 | 14.87 | 14.99 | Normal | | 12.3 |
| | Kelani Ganga | Kithulgala | m | 3.00 | 4.00 | 6.00 | 2.42 | 2.45 | Normal | | 20.7 |
| | Gurugoda Oya | Holombuwa | m | 3.00 | 3.40 | 5.00 | 4.34 | 4.32 | Minor Flood | Falling | 17.3 |
| | Seethawaka Ganga | Deraniyagala | m | 4.80 | 5.80 | 6.40 | 2.45 | 2.22 | Normal | | 37.2 |
| | Kehelgamu Oya | Norwood | m | 1.50 | 3.00 | 4.50 | 2.57 | 2.50 | Alert | Falling | 12.7 |
| Kalu Ganga (RB 03) | Kalu Ganga | Putupaula | m | 3.00 | 4.00 | 5.00 | 1.55 | 1.58 | Normal | | 8.6 |
| | Kalu Ganga | Ellagawa | m | 10.00 | 10.70 | 12.20 | 7.33 | 7.45 | Normal | | 15.0 |
| | Kalu Ganga | Rathnapura | m | 5.20 | 7.50 | 9.50 | 5.30 | 5.45 | Alert | Rising | 21.1 |
| | Magura Ganga | Magura | m | 4.00 | 6.00 | 7.50 | 3.17 | 3.24 | Normal | | 10.5 |
| | Kuda Ganga | Kalawellawa (Millakanda) | m | 5.00 | 6.50 | 8.00 | 4.68 | 4.70 | Normal | | 12.1 |
| Gin Ganga (RB 09) | Gin Ganga | Baddegama | m | 3.50 | 4.00 | 5.00 | 3.08 | 3.08 | Normal | | 5.2 |
| | Gin Ganga | Thawalama | m | 4.00 | 6.00 | 7.50 | 2.56 | 2.58 | Normal | | 12.8 |
| Nilwala Ganga (RB 12) | Nilwala Ganga | Thalgahagoda | m | 1.40 | 1.70 | 2.80 | 1.70 | 1.69 | Alert | Falling | 2.3 |
| | Nilwala Ganga | Panadugama | m | 5.00 | 6.00 | 7.50 | 5.36 | 5.35 | Alert | Falling | 3.9 |
| | Nilwala Ganga | Pitabeddara | m | 4.00 | 5.00 | 6.50 | 2.12 | 2.08 | Normal | | 4.7 |
| | Urubokka Ganga | Urawa | m | 2.50 | 4.00 | 6.00 | 1.67 | 1.67 | Normal | | 9.4 |
| Walawe Ganga (RB 18) | Walawe Ganga | Moraketiya | m | 3.00 | 5.00 | 7.00 | 1.87 | 1.90 | Normal | | 6.6 |
| Kirindi Oya (RB 22) | Kirindi Oya | Thanamalwila | m | 4.00 | 5.00 | 5.50 | 5.41 | 5.21 | Minor Flood | Falling | 12.2 |
| | Kirindi Oya | Wellawaya | m | 4.40 | 5.40 | 5.90 | 2.50 | 2.45 | Normal | | 21.0 |
| | Kuda Oya | Kuda Oya | m | 6.90 | 8.40 | 8.80 | 5.10 | 5.06 | Normal | | 8.5 |
| Menik Ganga (RB 26) | Menik Ganga | Katharagama | m | 4.00 | 4.60 | 6.50 | 6.09 | 6.18 | Minor Flood | Rising | 9.6 |
| Kumbukkan Oya (RB 31) | Kumbukkan Oya | Nakkala | m | 5.00 | 6.00 | 7.50 | 4.62 | 4.96 | Normal | | 28.8 |
| Heda Oya (RB 36) | Heda Oya | Siyambalanduwa | m | 4.50 | 6.00 | 7.00 | 4.30 | 4.14 | Normal | | 22.9 |
| Maduru Oya (RB 54) | Maduru Oya | Padiyathalawa | m | 4.00 | 4.50 | 6.00 | 4.45 | 5.23 | Minor Flood | Rising | 57.0 |
| Mahaweli Ganga (RB 60) | Mahaweli Ganga | Manampitiya | m | 3.00 | 4.30 | 6.00 | 5.39 | 5.41 | Minor Flood | Rising | 20.7 |
| | Mahaweli Ganga | Weraganthota | m | 5.00 | 6.00 | 8.00 | 7.90 | 8.37 | Major Flood | Rising | 14.7 |
| | Mahaweli Ganga | Peradeniya | m | 5.00 | 7.00 | 9.00 | 8.58 | 8.50 | Minor Flood | Falling | 45.3 |
| | Mahaweli Ganga | Nawalapitiya | m | 3.50 | 5.00 | 6.00 | 3.31 | 3.30 | Normal | | 37.9 |
| | Badulu Oya | Thaldena | m | 3.00 | 4.00 | 5.00 | 4.10 | 4.60 | Minor Flood | Rising | 97.3 |
| Yan Oya (RB 67) | Yan Oya | Horowpothana | m | 6.00 | 7.50 | 10.50 | 7.75 | 7.76 | Minor Flood | Rising | 36.1 |
| Maa Oya (RB 69) | Mukunu Oya | Yaka Wewa | m | 4.00 | 5.00 | 6.00 | 5.68 | 5.70 | Minor Flood | Rising | 55.3 |
| Malwathu Oya (RB 90) | Malwathu Oya | Thanthirimale | m | 5.00 | 6.80 | 7.80 | 8.35 | 8.46 | Major Flood | Rising | 82.4 |
| Mee Oya (RB 95) | Mee Oya | Galgamuwa | m | 4.84 | 5.94 | 8.00 | 5.67 | 5.79 | Alert | Rising | 22.2 |
| Deduru Oya (RB 99) | Deduru Oya | Moragaswewa | m | 4.75 | 6.00 | 7.00 | 6.35 | 6.42 | Minor Flood | Rising | 28.2 |
| Maha Oya (RB 102) | Maha Oya | Badalgama | m | 5.00 | 6.20 | 9.60 | 7.40 | 7.60 | Minor Flood | Rising | 16.8 |
| | Maha Oya | Giriulla | m | 5.50 | 6.50 | 7.50 | 8.34 | 8.39 | Major Flood | Rising | 15.8 |
| Attanagalu Oya (RB 103) | Attanagalu Oya | Dunamale | m | 3.30 | 4.40 | 5.50 | 4.02 | 4.04 | Alert | Rising | 3.8 |

**නායයෑම් පිළිබඳ අවවාදත්මක නිවේදනය 2025.11.27 දින 1600 පැයට (2025.11.28 දින 1600 පැය දක්වා )**

| දිස්ත්‍රික්කය | විමසිලිමත් මට්ටම (කහ) | අවදානම් මට්ටම (ඇම්බර්) | ඉවත්වීම (රතු) |
|---|---|---|---|
| බදුල්ල | | හල්දුම්මුල්ල, ඇල්ල, බණ්ඩාරවෙල, හපුතලේ, සොරණතොට | බදුල්ල, හාලි ඇල, පස්සර, වැලිමඩ, ඌව පරණගම, මීගහකිවුල, කන්දකැටිය, ලුණුගල |
| කොළඹ | පාදුක්ක, සීතාවක | | |
| ගාල්ල | | තවලම, නෙළුව | |
| ගම්පහ | අත්තනගල්ල | | |
| හම්බන්තොට | ඕකේවෙල, වලස්මුල්ල, තංගල්ල, බෙලිඅත්ත, වීරකැටිය | | |
| මහනුවර | | | උඩුදුම්බර, මිනිපේ, දොළුව, මැදදුම්බර, පාතහේවාහැට, ගඟඉහල කොරලේ, උඩපලාත, දෙල්තොට, ගඟවටකෝරලේ, අකුරණ, උඩුනුවර, යටිනුවර, පාතදුම්බර, තුම්පනේ, පස්බාගේකොරලේ, පන්විල, හාරිස්පත්තුව, පූජාපිටිය, කුණ්ඩසාලේ, හතරලිද්ද |
| කෑගල්ල | | කෑගල්ල, වරකාපොල, ගලිගමුව, රුවන්වැල්ල, යටියන්තොට, දැරනියගල, දෙහිඕවිට | රඹුක්කන, අරණායක, මාවනැල්ල, බුලත්කොහුපිටිය, |
| කුරුණෑගල | | පොල්ගහවෙල, නාරම්මල, අලව්ව | මල්ලවපිටිය, මාවතගම, රිදීගම |
| මොණරාගල | | බඩල්කුඹුර, වැල්ලවාය | බිබිල, මැදගම |
| මාතලේ | | | යටවත්ත, විල්ගමුව, අඹන්ගඟ කෝරලේ, උකුවෙල, රත්තොට, නාඋල, පල්ලෙපොල, ලග්ගල පල්ලේගම, මාතලේ, |
| මාතර | පස්ගොඩ, හක්මන, මුලටියන, කඩවත් සතර, පිටබැද්දර, කොටපොල, කිරින්ද පුහුල්වැල්ල, කඹුරුපිටිය, දික්වැල්ල, දෙවිනුවර, තිහගොඩ, වැලිපිටිය, අතුරලිය, අකුරැස්ස, වැලිගම, මාලිම්බඩ | | |
| නුවරඑළිය | | | වලපනේ, හඟුරන්කෙත, නිල්දණ්ඩාහින්න, මතුරට නුවරඑළිය, කොත්මලේ නැගෙනහිර, කොත්මලේ බටහිර, තලවකැලේ, අඹගමුව, නෝර්වුඩ් |
| රත්නපුර | ඇඹිලිපිටිය, කිරිඇල්ල, ඕපනායක, වැලිගෙපොල, පැල්මඩුල්ල | රත්නපුර, කොලොන්න, කලවාන, ඇලපාත, අයගම, බලංගොඩ, කහවත්ත , ඉඹුල්පෙ, නිවිතිගල, | |

*(මූලාශ්‍ර - NBRO)*

## ප්‍රධාන ජලාශ ආශ්‍රිත වාන් දොරටු විවෘත කිරීම් ( 2025.11.27 දින 1800 පැයට )

| අනු අංකය | දිස්ත්‍රික්කය | ජලාශය | විවෘත කර ඇති වාන් දොරටු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | රාජාංගනය | වාන්දොරටු 12 අඩි 06 බැගින් ද<br>වාන්දොරටු 06 අඩි 05 බැගින් ද<br>වාන්දොරටු 04 අඩි 04 බැගින් ද විවෘතකර ඇත. |
| 02 | | අංගමුව | වාන්දොරටු 02 අඩි 06 බැගින් විවෘතකර ඇත. |
| 03 | | කලාවැව | වාන්දොරටු 02 අඩි 04 බැගින් විවෘතකර ඇත. |
| 04 | කුරුණෑගල | දැදුරු ඔය | වාන්දොරටු 08 අඩි 17 බැගින් ද විවෘතකර ඇත. |
| 05 | මහනුවර | පොල්ගොල්ල | වාන්දොරටු 03 අඩි 02 අඟල් 06 බැගින් විවෘතකර ඇත. |
| 06 | මොණරාගල | වෙහෙරගල | වාන්දොරටු 02 අඩි 01 බැගින්ද<br>වාන්දොරටු 04 අඟල් 06 බැගින් ද විවෘතකර ඇත. |
| 07 | මාතලේ | බෝවතැන්න | වාන්දොරටු 06 අඩි 03 බැගින් විවෘතකර ඇත. |
| 08 | මහනුවර | රන්ටැඹේ | වාන්දොරටු 02 මීටර් 2 ½ බැගින් විවෘතකර ඇත. |
| 09 | බදුල්ල | උල්හිටිය - රත්කිඳ | වාන්දොරටු 07 අඩි 01 බැගින් විවෘතකර ඇත. |
| 10 | කළුතර | කුකුලේගඟ | වාන්දොරටු 02 තත්.ඝන මීටර් 50 බැගින් විවෘතකර ඇත. |
| 11 | හම්බන්තොට | ලුණුගම්වෙහෙර | වාන්දොරටු 06 අඩි 01 අඟල් 07 බැගින් විවෘතකර ඇත. |

(මූලාශ්‍ර - අදාළ වාරි ඉංජිනේරු කාර්යාල)

## 2025.11.27 දින 1800 පැයට මාර්ග ජලයෙන් යටවී ඇති ස්ථාන

❖ අම්පාර දිස්ත්‍රික්කය

- අලයඩිවෙම්බු ප්‍රා.ලේ. කොට්ඨාශයේ අක්කරෙයි පත්තු - කන්ජන්කුඩා ප්‍රධාන මාර්ගය සහම කෝ්සුව අසලින් අඩි 2 ½ පමණ යටවී ඇත. මාර්ගය වසා ඇත.
- සමන්තුරේ ප්‍රා.ලේ. කොට්ඨාශයේ අම්පාර - කරෙයිතිව් ප්‍රධාන මාර්ගය වලතපිඩ්ඩි යන ස්ථානයේ අඩි 02 ක් පමණ ජලයෙන් යටවි ඇත.
- අම්පාර ප්‍රා.ලේ. කොට්ඨාශයේ අම්පාර - ඉඟිනියාගල ප්‍රධාන මාර්ගය කොන්ඩුවෙඩ්ඩුවාන් කෝ්සුව අසලින් අඩි 1 ½ පමණ ජලයෙන් යටවි ඇත.
- කරයිතිව් ප්‍රා.ලේ. කොට්ඨාශයේ කල්මුණේ - අම්පාර ප්‍රධාන මාර්ගය මාවඩිපිල්ලි කෝ්සුව අසලින් අඩි 02 පමණ ජලයෙන් යටවි ඇත.
- නවිතන්වේලි ප්‍රා.ලේ. කොට්ඨාශයේ කිඩන්ගි පාලම අසලින් අඩි 03 ක් පමණ ජලයෙන් යටවී ඇත. මාර්ගය වසා ඇත.
- පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාශයේ පොතුවිල් - ලාහුගල ප්‍රධාන මාර්ගයේ 02 වන සැතපුම් කණුව අසල අඩි 1 ½ පමණ ජලයෙන් යටවී ඇත.

❖ මොණරාගල දිස්ත්‍රික්කය

- සියඹලාණ්ඩුව ප්‍රා.ලේ.කො. කෝන්ගස්පිටිය ග්‍රා.නි. වසමේ සුගලාදේවී වැවේ පිටවාන වන කෝ්සුව හා පුස්කිවුල කෝ්සුව ජලයෙන් යටවී ගමනාගමනයට බාධා සිදුව ඇත.
- මඩුල්ල ප්‍රා.ලේ.කොට්ඨාශයේ මාරි අරාව ග්‍රා.නි. වසමේ යමින් ආර සහ ගංගොඩආර පිටාර ගැලීමෙන් ගමනාගමනයට බාධා සිදුව ඇත.

- ❖ අනුරාධපුර දිස්ත්‍රික්කය
  - ➢ කැකිරාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ කැකිරාව - හදුන්ගම හරහා ගල්නෑව මාර්ගය අඩි 02 1/2 ක් ජලයෙන් යටවී ගමනාගමනයට බාධා සිදුව ඇත.
  - ➢ කැකිරාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ අවුකන හරහා කලාවැව මාර්ගය අඩි 02ක් ජලයෙන් යට වී ගමනාගමන බාධා සිදුවිය ඇත.
  - ➢ පදවිය ප්‍රා.ලේ. කොට්ඨාශයේ බුද්ධංගල ග්‍රා.නි. වසමේ වැළි ඇල සපත්තු පාලම හා වව්නියා පරාක්‍රමපුර මා ඔය සපත්තු පාලම හරහා අඩි 03ක් පමණ ජලයෙන් යටවී ඇත.

- ❖ පොළොන්නරුව දිස්ත්‍රික්කය
  - ➢ සෝමවති විහාරස්ථානයට ගමන්ගන්නා මාර්ගයේ කොටසක් අඩි 01ක පමණ ජල මට්ටක් පවතින අතර, පවතින අධික වර්ෂාවත් සමඟ ජලමට්ටම ඉහලයා හැකි බැවින් ප.ව 5.00න් පසු නැවත දැනුම්දෙන තුරු සියළු වාහන ගමන්කිරීම තාවකාලිකව නතර බව දැනුම් දී ඇත.
  - ➢ පොළොන්නරුව මඩකලපුව ප්‍රධාන මාර්ගය (ගල් ලැල්ලේ සිට මනම්පිටිය දක්වා ) පෙ.ව 2.45 සිට සියළුම වාහන සදහා නතර කර ඇත.

- ❖ මාතර දිස්ත්‍රික්කය
  - ➢ මුලටියන ප්‍රා.ලේ. කොට්ඨාශයේ මාකඳුර නගරයේ පාලම අසල මාර්ගය ජලයෙන් යටවී ඇති අතර විකල්ප මාර්ග ලෙස මාකඳුර - මූලනවත්ත මාර්ගය භාවිතා කෙරේ.

**අවසන් පැය 24 තුල වර්ෂාපතන දත්ත ( 2025.11.27 දින 1800 පැයට )**

| දිස්ත්‍රික්කය | ස්ථානය | වර්ෂාපතනය (මි.මි) | ප්‍රා.ලේ.කොට්ඨාශය |
|---|---|---|---|
| මහනුවර | කයිකාවල | 373.00 | උඩුදුම්බර |
| මහනුවර | උඩුදුම්බර | 350.40 | උඩුදුම්බර |
| මහනුවර | නුගතැන්න | 266.40 | උඩුදුම්බර |
| මහනුවර | මඩුගල්ල | 243.60 | දොළුව |
| මහනුවර | මාරස්සන | 235.20 | පාතහේවාහැට |
| බදුල්ල | වැවේගම | 225.80 | ඌව පරණගම |
| බදුල්ල | කැන්දගොල්ල | 224.20 | කැන්දගොල්ල |
| බදුල්ල | වියලුව | 222.20 | කන්දකැටිය |
| මහනුවර | උඩිස්පත්තුව | 215.60 | මැදදුම්බර |
| මහනුවර | මොරහේන | 211.60 | දොළුව |
| මහනුවර | මැදමහනුවර | 208.60 | මැදදුම්බර |
| බදුල්ල | ඌව වෙල්ලස්ස | 204.80 | බදුල්ල |
| කුරුනෑගල | මදුරගොඩ | 201.40 | රදීගම |
| බදුල්ල | ස්ප්‍රිංවැලි | 200.20 | හාලිඇල |
| බදුල්ල | මීගහකිවුල | 199.60 | මීගහකිවුල |
| බදුල්ල | බෝගහමඩිත්ත | 194.00 | හාලිඇල |
| බදුල්ල | උඩුවර | 185.80 | හාලිඇල |
| මහනුවර | හින්දගල | 182.40 | ගඟවටකෝරලේ |
| කෑගල්ල | කොටවැල්ල | 180.00 | රඹුක්කන |
| කෑගල්ල | හෙම්මාතගම | 172.20 | මාවනැල්ල |
| මහනුවර | දූන්හින්න | 172.00 | මැදදුම්බර |
| මහනුවර | මහනුවර NTS | 163.60 | ගඟවටකෝරලේ |
| මහනුවර | නිල්ලම්බෙ | 161.80 | දොළුව |
| බදුල්ල | හාලිඇල | 156.80 | හාලිඇල |
| මහනුවර | ගලහල | 154.60 | දෙල්තොට |
| බදුල්ල | ඩවුන්සයිට් ස්ටේට් | 150.80 | ඌව පරණගම |
| මහනුවර | පල්ලෙවෙල | 262.40 | උඩුදුම්බර |

*(මූලාශ්‍ර - NBRO/Met)*

**2025.11.27 දින 1800 පැයට බෝට්ටු හා හට පිරිස් ස්ථානගත කිරීම්**

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කාර්යාලය | යොදවා ඇති ස්ථානය | ස්ථානගත කිරිම |
|---|---|---|---|
| ගාල්ල | තවලම | අශෝකාරාමය - තවලම | නාවික හමුදාවේ 01 X 10 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | නාගොඩ | නාගොඩ ප්‍රා.ලේ. කාර්යාලය | නාවික හමුදාවේ 01 X 05 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | | විද්‍යාතිලක පිරිවෙන - නාගොඩ | නාවික හමුදාවේ 01 X 05 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | නෙළුව | සුදර්ශනාරාමය - නෙළුව | යුද්ධ හමුදාවේ 01 X 16 හට පිරිසක් සමඟ OBM 01, ඩිංගි 01 ක් ස්ථානගත කර ඇත. |
| මාතර | අතුරලිය | පානදුගම | යුද්ධ හමුදාවේ (3 ගැහේබ) 01 x 05 හට පිරිසක් යුනි බෆල් රථ 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | කඹුරුපිටිය | කඹුරුපිටිය පොලිසිය | යුද්ධ හමුදාවේ (9 ශ්‍රීලංසිරෙ) 01x 05 හට පිරිසක් යුනි බෆල් රථ 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| රත්නපුර | රත්නපුර | නව නගරය - රත්නපුර | නව නගරයේ නාවික හමුදාවේ 03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |

ප්‍ර.පො.ප ආර්.ඩී. දළුගොඩ
රාජකාරි භාර නිළධාරී
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය